නුවරඑළිය නාගරික කොමසාරිස්
நுவரெலியா மாநகர சபை ஆணையாளர்
The Municipal Commissioner Nuwara Eliya

කාර්යාලය / அலுவலகம் / Office 052-2222275 / 052-2222274
ෆැක්ස් / தொலைநகல் / fax 052-2222274

මගේ අංකය / எனது இல / My No ........................
ඔබේ අංකය / உமது இல / Your No ........................

නාගරික කාර්යාලය
மாநகர சபை அலுவலகம்
The Municipal Office

2024.07.19

නාගරික කොමසාරිස්
කොළඹ මහානගර සභාව
CWW කන්නන්ගර මාවත
කොළඹ 07

**ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් ප්‍රදර්ශනය කරන සරුංගල් ගුවන් සංදර්ශනය - 2024**
**Sri Lanka Heritage International Kite Airshow -2024 (SLHIKA -24)**

මෙම SLHIKA -24 සරුංගල් සැණකෙළිය ශ්‍රී ලංකා ජාතික රූපවාහිනී සංස්ථාවේ මාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් හා නුවරඑළිය මහා නගර සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇතුළු සියළු රාජ්‍ය ආයතන, පොලීසිය හා ත්‍රිවිධ හමුදාව, සියලුම පාසල් හා වෘත්තීය පුහුණු ආයතන , රාජ්‍ය හා පෞද්ගලික බැංකු, Ravana Aviation Kite Association , පෞද්ගලික අංශ සහ නුවරඑළිය සංචාරක හෝටල් සංගමය සමඟ එක්ව පැවැත්වීමට සැලසුම් කර ඇත. විනෝදාස්වාදය සඳහා නුවරඑළිය නගරය වෙත පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හට නවමු අත්දැකීමක් එක් කරමින් 2024 අගෝස්තු මස 17 හා 18 දෙදින නුවරඑළිය ග්‍රෙගරි වැව පරිශ්‍රයේදී මෙම සැණකෙළිය පැවැත්වීමට නුවරඑළිය මහා නගර සභාව විසින් කටයුතු යොදා ඇත.

02. මෙම සැණකෙළිය පළමු දිනය ළමුන් සඳහා හා දෙවන දිනය වැඩිහිටියන් සඳහා පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ළමා සරුංගල් සංදර්ශනය මගින් ලෝක සාමය ප්‍රවර්ධනය කිරීම ,මිනිසුන් අතර අවබෝධය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම, එළිමහන් ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් අතර ප්‍රවර්ධනය කිරීම, සරුංගල් සෑදීමේ මෙන්ම යැවීමේ කලාව ප්‍රචලිත කිරීම ඉලක්ක කරගනිමින් හා "ලෝක සාමය හා සමඟිය" මෙම සැණකෙළියෙහි ප්‍රධාන අරමුණ කරගනිමින් මෙම සැණකෙළිය පැවැත්වීමට සැලසුම් කර ඇති අතර මෙම ඉසව්ව මගින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා රුකුලක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු.

03. මෙම සරුංගල් සැණකෙළිය සඳහා දේශීය සංචාරකයින් හට මෙන්ම විදේශීය සංචාරකයින්ටද සහභාගීවීමට අවස්ථාව ලබා දී ඇති අතර එමඟින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටද අපේක්ෂා කරමු. එමෙන්ම දේශීය සංස්කෘතිය හා දේශීය අනන්‍යතාවය සරුංගල් මඟින් ප්‍රදර්ශනය කිරීමටත් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පළාත් 09 තුළ ඒ ඒ පළාතට අනන්‍ය වූ අංගයන් ගුවනෙහි ප්‍රදර්ශනය වීමට සැලැස්වීමටත් අපේක්ෂා කරමු. එහිදී ඔබගේ පළාත් පාලන ආයතනයේ නිල ලාංඡනය හා ඔබ නගරයට ආවේණික සංස්කෘතික උරුමයක් සහිත සරුංගල් දෙකක් ගුවනෙහි ප්‍රදර්ශනය කිරීම සඳහා ඔබගේ මහා නගර සභාවට ද අවස්ථාවක් ලබාදීමට තීරණය කළ අතර ඒ හරහා ඔබ පළාත් පාලන ආයතනයේ නිල ලාංඡනය හා ඔබ නගරයට අවේණික සංස්කෘතික උරුමය ලොවට ප්‍රදර්ශනය කිරීමටත් රාජ්‍ය නිලධාරීන් අතර සහයෝගය වර්ධනය කිරීමටත් නිලධාරීන්ගේ නිර්මාණශීලීත්වය ඉහළ නැංවීමටත් හැකියාව ලැබෙනු ඇති බවට විශ්වාස කරමු.

නිල නිවස / வாசஸ்தலம் / Residence 052-2222371
ඊ-මේල් / மின்அஞ்சல் / E-mail nuwaraeliyamc75@yahoo.com
වෙබ් / இணையத்தளம் / Web www.nuwaraeliya.mc.gov.lk

04. මෙමගින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් එකම අහස්තලයක ප්‍රදර්ශනය කිරීමෙන් ශ්‍රී ලංකා අනන්‍යතාවය සරුංගල් ගුවන් සංදර්ශනයක් ලෙස කලාත්මකව ප්‍රධාන සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස ගෝලීයව ස්ථාපිත කිරීමට හැකිවනු අතර ඒ සඳහා රාජ්‍ය නිළධාරීන් ලෙස අපටද දායක වීමට හැකිවනු ඇත.

05. මෙම සරුංගල් සෑදීම සඳහා වෘත්තීමය දැනුම Ravana Aviation Kite Association මඟින් ලබා දෙන බවද වැඩිදුරටත් දන්වා සිටින අතර, මෙම සැණකෙළියට ක්‍රියාකාරීව දායකත්වය ලබා දිය හැකි ඔබ ආයතනයෙන් නිළධාරීන් දෙදෙනෙකු සහභාගී කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර මෙම නිළධාරීන්ගේ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔබ ආයතනය විසින් දැරිය යුතු බවත් අවශ්‍ය වුවහොත් නවාතැන් පහසුකම් සම්බන්ධීකරණය කල හැකි බවත් වැඩිදුරටත් දන්වා සිටිමි

06. ඒ සඳහා පහත ආකෘතිය අනුව මෙම වැඩසටහන සඳහා සහභාගී වන නිළධාරීන්ගේ විස්තර 2024.07.26 වන දිනට පෙර නුවරඑළිය මහා නගර සභාවේ Nuwaraeliyamc75@yahoo.com හෝ nuwaraeliyamc@75gmail.com විද්‍යුත් තැපැලට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| ආයතනයේ නම | සහභාගී වන නිළධාරියාගේ නම | දුරකතන අංකය | Whatsapp අංකය | ඉදිරිපත් කරනු ලබන සරුංගල් ආකෘතිය පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| | | | | |

06. තවද මෙම සැණකෙළිය සම්බන්ධ සවිස්තර වාර්තාවක් ඔබගේ විද්‍යුත් තැපැලට යොමු කර ඇති බවට වැඩිදුරටත් දන්වා සිටින අතර ,මේ සම්බන්ධව වැඩිදුරටත් විස්තර 071-4474551 (නාගරික ලේකම්-කේ.එම්.එච්.ඩබ්.බණ්ඩාර මහතා) අංකයට ඇමතීමෙන් ලබා ගැනීමේ හැකියාව ඇති බවට වැඩිදුරටත් දන්වමු.

07. මේ සම්බන්ධයෙන් ඔබ විසින් ලබා දෙන සහය ඉතා අගය කොට සලකමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී විජේතිලක
නාගරික කොමසාරිස්
මහා නගර සභාව - නුවරඑළිය

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක
නාගරික කොමසාරිස්
මහා නගර සභාව
නුවරඑළිය.

0774333143 — ප්‍රශාන්
Computer operator.